# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර
# රැස්වීම් වාර්තාව

**01.දිනය** :- 2023.10.06 **වේලාව** - පෙ.ව. 09.30

**02.ස්ථානය** :- අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය.

**03.ප්‍රධානත්වය** :- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා.

**04.මෙහෙයවීම** :- දිස්ත්‍රික් ලේකම් චින්තක අබේවික්‍රම මහතා.

**05.සහභාගීත්වය** :- මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පලාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරින් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම I)

**06. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම.**

දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිතුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව අමතමින්, මුලින්ම පැමිණ සිටි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇතුලු පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් ඉතා සුහදව පිළිගන්නා ලදි. අනතුරුව ගරු සමසභාපතිවරුන් වෙත දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා භාර දෙන ලදි.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා , සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට, සියළුම ආයතන ප්‍රධානීන්ට, සියළුම ආරක්ෂක අංශවල ප්‍රධානීන්ට සහ අම්පාර දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය නිළධාරීන් පිළිගෙන ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනයට සහ 2023 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්තුමන්ට ආරාධනා කරන ලදී.

**07. ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය.**

**7.1 2023/2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.**

මහ කන්නයේ වගා කටයුතු සැලැස්ම දිසාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී එහිදී මේවන විට මහ කන්නයට අදාල දකුණු ඉවුර වම් ඉවුර ගොවි සංවිධාන සමග කන්න රැස්වීම් පවත්වා ඇති බවත් ලබන 12 වෙනිදා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාල කන්න රැස්වීම පවත්වන බවත් පැවසසීය. මෙවර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම කන්නයට අදාල පොහොර නිර්දේශය කන්න රැස්වීම් වලදී ගොවීන්ට ලබා දුන් බවත්, මෙවර වගා බිම් සැකසීමේදී විශේෂයෙන් වැසි දියෙන් කිරීමට බලාපොරොත්තු වන බවත්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලබන ජනවාරි පෙබරවාරි මාසවල වැසි නොලැබෙන බවට පුරෝකථනය කර ඇති බැවින් වැව්වල ජලය ලබන යල කන්නයට තබාගතයුතු බවත් පැවසීය. ඔක්තොම්බර් 15වනදා වන විට මහ ආරම්භ කලයුතු බවත්, එවිට වැසි නොලැබුනොත් සේනානායක සමුද්‍රයෙන් ජලය ලබාදීමට සියළු කටයුතු සූදානම් බවත් පැවසීය.

## 08. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂතුමා විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් පැහැදිළි කිරීමක් කරන ලදී. මේ යටතේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති 2 (රුපියල් මිලියන 0.6 සහ රුපියල් මිලියන 1) එළුවන් බෙදාදීමේ ව්‍යාපෘතිය, අලි වැට ව්‍යාපෘතිය සහ යුනිසෙෆ් ආධාර යටතේ ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් සඳහා උදේ ආහාර ලබා දීමේ වැඩසටහනේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 02)

මෙහිදී දිස්ත්‍රික්කයේ සියළුම රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණට ඉදිරිපත් කිරීමට අදාල සියලු නිළධාරීන් නටයුතු කල යුතු බවට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.

## 09. දිස්ත්‍රික් මට්ටමින් විදේශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය

**9.1** කෘෂි නවීකරණ ව්‍යාපෘතිය (ASMP)

මෙහිදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී විමලවීර දිසානායක මැතිතුමා විසින් මෙම ව්‍යාපෘතිය යටතේ අනෝදා වගාව සඳහා උහන,පදියතලාව, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සාධාරණ ලෙස ගොවීන් තෝරා ගැනීම සිදුකරන ලෙස දැන්වීය.

මෙම වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කීපයක වගා ව්‍යාපෘති 4ක්(වියලි මිරිස්, රටකජු, කටු අනෝදා, දේශීය දෙමුහුම් බඩඉරිඟු)ක්‍රියාත්මක බව පැවසීය. නියමු ව්‍යාපෘති ලෙස කටු අනෝදා ගොවිමහතුන් 100ක් සමඟ අක්කර 100ක් පදියතලාවේ සිදුකර ඇති බවත්, තිරුක්කොවිල් ප්‍රදේශයේ අක්කර100ක් ගොවි මහතුන් 100ක් සමඟ කර ඇති බවත්, කටු අනෝදා නියමු ව්‍යාපෘතියේදී අතිරේක බෝග ලෙස කහ සහ රටකජු වගාවත් 2020දී ආරම්භ කර බවත් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කමිටුවට දන්වන ලදී. (ඇමුණුම 03)

**9.2** දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගැටළු පවතින්නේ දැයි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් විමසන ලදී. ගැටළු නොමැති බව ප්‍රකාශ කරන ලදී. (ඇමුණුම 04)

**9.3** ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)

මෙම ව්‍යාපෘතිය ලෝක බැංකුවේ ණය සහ යුරෝපා සංවිධානයේ ආධාර හා ලක් රජයේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් බවත්, මෙය පසුගිය ජූලි 31 වනදායින් අවසන් වීමට නියමිත වුවත් තවත් මාස 14ක් සඳහා අනුමැතිය හිමිවූ බවත් පැවසීය. එනිසා මෙම මාස 14 සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම මේ දිනවලදී සිදුකරන බවත් පැවසීය. මෙහි අදියර 2ක් (මූලික හා කායී සාධන අදියර) යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක බවත් මූලික අදියරේ ව්‍යාපෘති අවසන් බවත් පලාත් පාලන සහකාර කොමසාරිස් විසින් සඳහන් කරන ලදී. (ඇමුණුම 05)

**9.4** වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහනට ( CresMPA ) අදාළ ව්‍යාපෘති

2023.10.06 වන අද දින සවස 1.30ට පැවැත්වෙන රැස්වීමේදී සාකච්ඡා කිරීමට තීරණය විය.

**9.5** වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමණාකරණ ව්‍යාපෘති (IWWRMP)

2023.10.06 වන අද දින සවස 1.30ට පැවැත්වෙන රැස්වීමේදී සාකච්ඡා කිරීමට තීරණය විය.

## 10. දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනු කමිටු තීරණ අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම

දිස්ත්‍රික් ලේකම්තුමන් විසින් මෙම අනුකමිටු තීරණ ඉදිරිපත් කරන ලදී.

01 පාරිසරික වශයෙන් අධිසංවේදී ස්වාභාවික වෙරළබඩ ශාක ප්‍රජාවකින් යුත් ආරුගම්බේ, උල්ල වැලි කඳු වැටියේ ඉඩම පිළිබඳ සොයා බැලීමේ අනු කමිටු තීරණය

- මෙම කඳු වැටිය සහිත වානාන්තර භූමිය අධිසංවේදී කලාපයක් බවට හඳුනාගෙන ඇති අතර එම ඉඩම දීර්ඝ කාලීන බදු යටතේ බලපත්‍රලාභීන්ට බෙදා දීම නුසුදුසු බව අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට නිර්දේශ කිරීම,
- මෙම කලාපය තුළ පරිසර හිතකාමී සංචාරක ක්‍රියාකාරකම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වැඩිදියුණු කිරීම.
- මෙම ප්‍රදේශය තුළ නීත්‍යානුකූලව නිකුත් කරන ලද බලපත්‍රයක් සහිත ඉඩමක් ඇති බව අනාවරණය වූ බැවින් ඒ සඳහා විකල්ප ඉඩමක් ලබා දීමට නිර්දේශ කිරීම.

02. පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තරුණ ප්‍රජාව සඳහා ක්‍රීඩා පිටියක් ඉදි කිරීමට පොතුවිල් 11 (වට්ටිවේලි - ඉන්ෆෙක්ටර්ඒතම්) වසමට අයත් ඉඩමක් වෙන් කිරීමේ අනු කමිටු තීරණය

- එම ඉඩම පිළිබඳ අයිතිය තහවුරු කිරීම සඳහා තමන් සතු ලියවිලි සති 02 ක් ඇතුළත පොතුවිල් ප්‍රදේශීය ලේකම්ට ඉදිරිපත් කරන මෙන් දැනුම් දීම හා ඒ සඳහා දැන්වීම් පුවරුවක් එම ඉඩම් වල ප්‍රසිද්ධ කිරීම.

03. කල්මුණ උතුර සංස්කෘතික මධ්‍යස්ථානයට වෙන් කර ඇති ඉඩම සංවර්ධනය කිරීමට අවසර නොලැබීම සම්බන්ධ අනු කමිටු තීරණය

- එම සංස්කෘතික මධ්‍යස්ථානයට දීර්ඝ කාලීන බදු යටතේ ලබා දී තිබූ අවසරය ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා මගින් අවසන් බව දැනුම් දී ඇති බැවින් එම මධ්‍යස්ථානයේ සංස්කෘතික සමිතිය මඟින් කල්මුණ ප්‍රාදේශීය ලේකම් වෙත අවශ්‍ය සියලුම ලියවිලි ඉදිරිපත් කොට ඒ සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග කල්මුණ ප්‍රාදේශීය ලේකම් මඟින් සිදු කිරීම.

04. කල්මුණ උතුර පොලිස් ස්ථානය ස්ථිරව ස්ථාපනය කිරීමේ අනු කමිටු තීරණය

- මෙම පොලිස් ස්ථානය ස්ථාවරව ඉදිකිරීම සඳහා පෙරියනීලාවලි පිහිටි පරණ රෝහල වෙන් කිරීමට තීරණය විය. ඒ සඳහා එම ඉඩම් රෝහලට පරිත්‍යාග කළ අයිතිකරු සමඟ සාකච්ඡා කර ඔහුගේ එකඟත්වය ලබා ගැනීමටත් එය එසේ නොවේ නම් ඉඩම් අත්පත් කිරීමේ ආඥාපනත යටතේ අත්පත් කිරීමට තීරණය විය. ඒ සඳහා කල්මුණ ප්‍රාදේශීය ලේකම් හා කල්මුණ උතුර උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් ඉදිරි කටයුතු සිදු කිරීම.

05. අක්කරපත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පාසැල් වල ඇති ගැටළු නිරවුල් කිරීම සම්බන්ධ අනු කමිටු තීරණය

- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඔවුන්ගේ කැමැත්ත පරිදි ANC සායන මධ්‍යස්ථානය ක්‍රියාත්මක වීමට විරුද්ධත්වයක් නොමැති බවත් මෙම ස්ථානයේ අඛණ්ඩව මෙම සායනය පවත්වාගෙන යාමට සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි එකඟතාවය පලකරන ලද ANC සායන මධ්‍යස්ථානය දිගටම එම ස්ථානයේ පවත්වාගෙන යෑමෙහි කිසිදු වෙනසක් සිදු නොකිරීම.
- පට්ටියඩිපෙට්ටි අක්/අල් රහීමියා විද්‍යාලය ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇති ප්‍රධාන මාර්ගය අසල පිහිටි පාසලක් වන අතර මෙය ආසන්නයේ මහජන ක්‍රීඩාංගනයද පිහිටා ඇත. එම නිසා අක්/අල් රහීමියා විද්‍යාලය ශ්‍රේණි 1 සිට ශ්‍රේණි 13 දක්වා පිරිමි මහ විද්‍යාලයක් ලෙසට උසස් කිරීම.
- පල්ලිකුඩියිරුප්පු ප්‍රදේශයේ පිහිටා ඇති අක්/ අල් ෆායිෂා මහ විද්‍යාලය ගැහැණු ළමුන්ට ඉගෙන ගැනීමට සුදුසු ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇති නිසා එම පාසල ශ්‍රේණි 01 සිට ශ්‍රේණි 13 දක්වා කාන්තා උසස් පාසලක් ලෙසට උසස් කිරීම.
- පල්ලිකුඩිඉරුප්පු අක්/අල් ෆයිෂා මහ විද්‍යාලය කාන්තා උසස් පාසලක් ලෙස උසස් කිරීම නිසා එම ප්‍රදේශයට ශ්‍රේණි 01 සිට ශ්‍රේණි 05 දක්වා පිරිමි ප්‍රාථමික පාසලක් අවශ්‍ය වේ. ඒ සඳහා පල්ලියකුඩිඉරුප්පු ප්‍රදේශයේ පිහිටා ඇති අක්/මුහම්මදියා විද්‍යාලය ශ්‍රේණි 01 සිට ශ්‍රේණි 05 දක්වා පිරිමි ප්‍රාථමික පාසලක් ලෙස වෙනස් කිරීම.
- පට්ටියඩිපෙට්ටි අක්/අල් රහිමියා විද්‍යාලය පිරිමි මහ විද්‍යාලයක් ලෙස උසස් කිරීම නිසා එම ප්‍රදේශයේ සිටින ගැහැණු ළමුන්ට ශ්‍රේණි 01 සිට ශ්‍රේණි 05 දක්වා කාන්තා ප්‍රාථමික පාසලක් අවශ්‍ය වේ. කෙසේ

වෙතත් පට්ටියඩිපෙට්ටි අක්/අල් රහිමියා විද්‍යාලයට අවශ්‍ය ඉඩ, ගොඩනැගිලි පහසුකම් ඇති නිසා ප්‍රථම වශයෙන් එම පාසලේම ප්‍රාථමික පාසල ස්ථාපනය කර හැකිය. තවද මෙම පාසල අලුත් පාසලක් ලෙස ස්ථාපිත නොකර දැනට පිහිටා ඇති පල්ලියකුඩියිරුප්පු ලීඩර් අෂ්රෆ් විද්‍යාලයේ පට්ටියඩිපෙට්ටි අල්/රහිමියා විද්‍යාලයට ස්ථාන මාරු කිරීමට සුදුසු වේ.

- ලීඩර් අෂ්රෆ් පාසල අක්/අල් රහිමියා පාසලට ස්ථාන මාරු කිරීම හරහා එහි පෙර සිට පවත්වාගෙන එන පෙරපාසල අඛණ්ඩව පවත්වාගෙන යන අතර අක්/අල් රහිමියා පාසලේ පිහිටා ඇති විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට විශේෂ පාසලක් ලෙස මෙම පාසල මාරු කිරීම හෝ විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට පන්ති කාමර සකස් කිරීම.

ඉහත යෝජනා මෙම කමිටුවේ සමසභාපති ගරු ඩබ්.ඩී. වීරසිංහ (පා.ම) මැතිතුමා විසින් පළාත් සභාවට සහ මධ්‍යම ආණ්ඩුවේ රේඛීය අමාත්‍යාංශවලට යොමුකිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

06. අම්පාර නගරසීමාව තුළ පිහිටි වනජීවී කලාපයට අයත් නිදහස් කල ඉඩම් කොටස් වලින් කොටසක් නගරයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් භාරයේ තබා ගැනීම සම්බන්ධ අනුකමිටු තීරණය

- අම්පාර නගරයේ සංවර්ධනය කිරීම සඳහා වන ජීවී දෙපාර්තමේන්තුව මඟින් නිදහස් කළ ඉඩම් වලින් කොටසක් ඉදිරියේදී පොදු කටයුතු සඳහා වෙන් කර ප්‍රාදේශීය ලේකම් භාරයේ තැබීම.

## 11. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | පෙර පාසල්/ළමා සහ කාන්තා ඇතුළු අනෙකුත් කාර්යාංශ මගින් පසුගිය කාලය තුලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මොනවාද ?<br>එම ව්‍යාපෘති කුමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කලේද ? යන වග | මෙහිදී ප්‍රතිලාභීන් තෝරාගත් ආකාරය, ප්‍රතිලාභීන්ගේ විස්තර කිසිවක් දේශපාලන අධිකාරිය දැනුවත් භාවයකින් තොරව සිදුකර ඇති බැවින්,<br>සියළුම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එම ව්‍යාපෘතියේ සහ ප්‍රතිලාභීන්ගේ විස්තර අදාල ප්‍රාදේශීය සංවර්ධන කමිටුව සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර ක්‍රියාත්මක කලයුතු බවට තීරණය විය. |
| 02. | වන අලියෙකු මියගිය විට මිහිදන් කිරීම, වන අලියා මියගිය ස්ථානය අනුව ඒ ඒ ඉඩම් අයිති ආයතනය මඟින් මිහිදන් කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙහි අනුමැතිය ලබා ගැනීම. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදුන් අතර වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීමට තීරණය විය. |
| 03. | 2023 වර්ෂයේදී වන අලි පහරදීම් වලින් සිදුවූ ජීවිත හානි 04ක් සඳහා රු. ලක්ෂ 09 බැගින් සහ දේපළ හානි 24ක් සඳහා වන්දි මුදල් ගෙවීමට ඇතත් ප්‍රතිපාදන නොලැබීම. | මේවන විට රුපියල් මිලියන 17.34561 ප්‍රතිපාදන ලැබී ඇති අතර ඉදිරි සති 2 ඇතුලත මෙම මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී ගෙවීම් සිදුකරන බව වනජීවී සහකාර අධ්‍යක්ෂ පැවසීය. |
| 01. | රජයේ ඉඩම් බලතල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුද නැතිනම් ප්‍රාදේශීය ලේකම් සතු ද යන්න අවිනිශ්චිත හෙයින් ඉඩම් රාජකාරි වලදී මහජනතාව අපහසුතාවයට පත් වීම. | මහඔය පදියතලාව යන කොට්ඨාශවල මහවැලි අධිකාරියට හා ප්‍රාදේශීය ලේකම්ට අයත් ඉඩම් පවතින අතර ඒවා නිශ්චිතව වෙන් කොට හදුනාගත යුතු බවත්, මෙහිදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් මහවැලි අධිකාරියේ නිර්දේශ මත ප්‍රාදේශීය ලේකම් මගින් දිස්ත්‍රික් ඉඩම් කොමසාරිස්ගෙන් එම ඉඩම් සඳහා බලපත්‍ර ලබා ගැනීමට හැකියාව ඇති බව පැවසීය. |

| | | |
|---|---|---|
| 05. | අම්පාර සිට ගමනාන්තය අම්බලන්ඔය හංදිය දක්වා පොදු මඟීප්‍රවාහන බස්රථ සේවාව ගමන්වාරයක් හැර ගමන්වාරයක් තිඹිරිගොල්ල සහ එක්ගල්ඔය දක්වා අවසන් කිරීම හා ආරම්භ කිරීම. | ගමනාගමන මණ්ඩලය හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරය එක්ව සාකච්ජා කර ක්‍රියාත්මක කිරීමට තීරණය විය.තවද මෙහිදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරුඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් කහටගස්යාය පාසල් බස්රථය ධාවනය නොවීම සම්බන්ධයෙන් විමසූවිට එය අලුත් වැඩියාවට යොමුකර ඇති බවත් හැකි ඉක්මනින් ඒ වෙනුවට බස්රථයක් යෙදවීමට කටයුතු කරන බවත් ප්‍රාදේශීය කලමණාකරු විසින් දන්වන ලදී. |
| 06. | අම්/දමන මහා විද්‍යාලයේ 2024 වර්ෂයේ සියවස් සැමරුමට සමගාමීව උසස් පෙළ විෂය ධාරාව සඳහා තාක්ෂණවේදය විෂය ආරම්භ කිරීම සහ දමන මහා විද්‍යාල භූමියේ අම්පාර දිස්ත්‍රික් පාසල් කෞතුකාගාරයක් ඉදි කිරීම. | මෙම විද්‍යාලයේ සියවස් සැමරුමට සමගාමීව එංගලන්ත රජය විසින් මෙම විද්‍යාලය සංවර්ධනය කර දීමට පොරොන්දු වී ඇති අතර ඒ සඳහා ව්‍යාපෘති වාර්ථාවක් සකස් කරමින් පවතින බවත් එයට සමගාමීව තවත් පාසල් 5ක් සංවර්ධනය කර දීමටද තීරණය වී ඇති බවත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සදහන් කරන ලදී. එමෙන්ම තාක්ෂණ විෂය ධාරාවට විශාල ඉල්ලුමක් පැවතියද මේවන විට අම්පාර කලාපයේ පාසැල් 2ක් පමණක් මෙම විෂය ධාරාව උගන්වන බවත්, මෙහිදී ගුරුවරුන්ගේ හිඟයක් පවතින බවත් නවක බඳවා ගැනීම් සිදුකල යුතු බවත්, එම යෝජනාව අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවද දැන්වීය.<br>පාසැල් කෞතුකාගාරයක් ඉදි කිරීම සම්බන්ධයෙන් මීට පෙර අත්දැකීම් නැති බවත් ඒ සඳහා පවතින නිර්ණායක නීතිමය රාමුව පිළිබඳ සංස්කෘතික අමාත්‍යාංශය හා සම්බන්ධ වී කරුණු සොයා බැලිය යුතු බව අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පැවසීය. |
| 07. | ශ්‍රී ලාංකිය මව්වරුන් විදේශගත වීමේදී දරුවාගේ භාරකාරීත්වය සහ ආරක්ෂාව සම්බන්ධව පවතින ගැටලු පිළිබඳ විධිමත් තීරණ ලබා ගැනීම. | මව්වරුන් විදේශ ගත වී ඇති දරුවන්ගේ ආරක්ෂාව හා භාරකාරත්වය සම්බන්ධයෙන් ගැටළු ඇති වී ඇති අවස්ථාවක පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ සඳහා මැදිහත්වී අධිකරණය මගින් දරුවාගේ භාරකාරත්වය සම්බන්ධයෙන් අවුරුදු 03ක් දක්වා සුදුසු පුද්ගල නියෝගයක් ලබා ගැනීමට හැකියාව ඇති බවත් නැතහොත් සිද්ධි සමුළුවක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතහැකි බවත් දිස්ත්‍රික් පරිවාස නිළධාරී විසින් සදහන් කරන ලදී.<br>එමෙන්ම මව්වරුන් විදේශගත වීමේදී දරුවන්ගේ වයස පිළිබඳ පෙරපැවති වයස් සීමාවටම(අවු. 05 දක්වා) වන ලෙස ඉල්ලා අමාත්‍යාංශයට යොමු කිරීමට තීරණය විය. |
| 08. | මත් ද්‍රව්‍යන්ට ඇබ්බැහිවූ අය සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදි කිරීම | ජාතික අන්තරායක ඖෂධ පාලක මණ්ඩලයේ දිස්ත්‍රික් සමබන්ධීකාර විසින් පෙර වසරවලට සාපේක්ෂව මෙම වසරේ මතට ඇබ්බැහිවූ අයගේ විශාල වැඩිවීමක් පවතින බවත්, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා දිස්ත්‍රික්කයෙන් පිටත පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත ගෙන යාමේදී විශාල වියදමක් දැරීමට වන බවත් එම මධ්‍යස්ථාන වල ධාරිතාවය ඉක්මවා ඇති බවත්, එලෙස ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සදහා දෙමල බස හසුරුවන නිලධාරීන්ගේ විශාල හිඟයක් බවතින බවත්, පවතින නිර්ණායක අනුව පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් පිහිටුවීමට ගොඩනැගිලි සහිත ඉඩමක් ලබා දෙන්නේ නම් ඉදිරි කටයුතු සිදුකල හැකි බවත් පවසන ලදී.<br>මේ සඳහා ගොඩනැගිලි සහිත ඉඩමක් ලබාදීමට හැකිදැයි සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස |

| | | |
|---|---|---|
| | | නැගෙනහිර ප්‍රධාන ලේකම් වෙත කමිටුව විසින් දන්වන ලදී. |
| 09. | දහම් පාසල් වලට සිසුන් පැමිණීම බෙහෙවින් අඩාලව ඇති බැවින් ඉරු දින පෙ.ව.06 සිට ප.ව 2.00 දක්වාත් පොහෝ දින දවස පුරාමත් අතිරේක පන්ති පැවැත්වීම නවතාලීම. | යෝජනාව අනුමත කරන ලදී. මෙහිදී අදාත් අධ්‍යාපන ලේකම් විසින් මේවන විට උපකාරක පංති නියාමනය සඳහා නව චක්‍රලේඛන 2ක් ඉදිරි සතියේ නිකුත් කිරීමට කටයුතු සූදානම් කර ඇති බවත් පැවසීය.<br>මේ සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල අවධානය යොමුකර කටයුතු කරන ලෙස තීරණය විය. |
| 10. | වන අලි ගම් වැදී ගෙවතු සහ දේපලවලට අලාභ හානි සිදු කිරීම | මේ මස 9,10,11 යන දින වල අලි පලවා හැරීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කරන බව වනජීවී අධ්‍යක්ෂ පැවසීය. |
| 11. | අක්‍රමවත් කානු පද්ධතිය නිසා වැසි කාලයේදී සහිරා විද්‍යාලයීය ක්‍රීඩා පිටියේ ගංවතුර තත්වයක් ඇතිවීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් පළාත් ප්‍රධාන ලේකම්ට මෙවර මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට වෙන් කරන මුදලින් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන මෙන් දැන්වීය. |
| 12. | නතරකර ඇති අලිවැට නැවත සකස් කිරීම සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම | ගොවියන් විසින් අලිවැට ඉදිකිරීමට මූල්‍ය දායකත්වය ලබා දීමට කැමැත්ත ලබාදී ඇතිබව ආලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් සඳහන් කරන හෙයින් අලිවැට සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස වනජීවී දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලදී. |
| 13. | වෙට්ටාරු ප්‍රදේශයේ ගොං කරත්ත වලින් වැලි ප්‍රවාහනය කිරීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් අවසර නොදීම | මෙලෙස සුළු වශයෙන් ගොං කරත්ත මගින් ගෙන යාමට අවසර දෙන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලදී. ඒ අනුව දැනට කැනීම් කරන ස්ථානයේ ලබාදිය නොහැකි බවත් ඊට ආසන්න සුදුසු තැනකින් වැලි ලබා ගැනීමට අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලෙස දැන්වීය. |
| 14. | අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ඇති සෙම්බුකුලම් සහ යානිවිලුන්දන් ඉඩම්වලට අදාළ ලිපි ලේඛන ආලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා ගැනීමට පියවර ගැනීම. | දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අනු කමිටුවක් පත් කර එම කමිටුවේ තීරණ ඊලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. |

## 12. සාකච්ඡා කළ වෙනත් යෝජනා

- පොතුවිල් ප්‍රදේශයේ ජනතාවට ගොවිතැන් කිරීම සඳහා හැඩඔයේ ජලය ප්‍රමාණවත් නොවන බවත් මුතුකණ්ඩිය වැවෙන් ජලය ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මුෂාරෆ් මැතිතුමා යෝජනා කරන ලදී. එබැවින් මේසඳහා මොණරාගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මොණරාගල දිස්ත්‍රික් ලේකම් වෙත මෙම යෝජනාව යොමු කිරීමට තීරණය කරන ලදී.

## 13. ස්තුති කථාව:-

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් පැමිණ සිටි සියලුදෙනාට ස්තුතිය පළකර රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චින්තක අබේවික්‍රම,
දිස්ත්‍රික් ලේකම්
අම්පාර

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

## දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය
## 2023.10.06

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | චින්තක අබේවික්‍රම | දිස්ත්‍රික් ලේකම් | |
| 2 | ගරු සෙන්තිල් තොන්ඩමන් | ආණ්ඩුකාරවර | |
| 3 | ගරු ඩබ්.ඩී.වීරසිංහ | සමසභාපති/පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 4 | ගරු ඒ.එල්.එම්.අතාවුල්ලා | සමසභාපති/පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 5 | ගරු ඩබ්. දිසානායක | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 6 | ගරු එස්.එම්.එම්.මුෂාරෆ් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 7 | ගරු සී. ගලප්පත්ති | සභාපති | පලාත් සභාව |
| 8 | ආර්.ජීම්.පී.ජිස්.රත්නායක | ප්‍රධාන ලේකම් | නැගෙනහිර පලාත්සභාව |
| 9 | එම්.එම්.ජී.බී.එම්.රෂාඩ් | ප්‍රාදේශීය සම්බන්ධීකාරක | NDDCB |
| 10 | එම්.එෆ්.කේ.මොහොමඩ් | ප්‍රාෙදේශීය සභාව සමන්තුර | ලේකම් |
| 11 | ආර්.අබිරිජිතන් | ජලජීවී වගා සංවධර්න නිළධාරී | ජලජීවී සංවධර්න - පලාත් |
| 12 | එච්.ඊ.එම්.ඩබ්.ජී.දිසානායක | ලේකම් | MOE - EP |
| 13 | ජී.රාජේස්කන්නා | වාරිමාගර් ඉජජිනේරු | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 14 | වෛද්‍ය එන්.ශ්‍රී.එම්. රෛරාර්ස් | වෛද්‍ය සැලසුම් | RDHS Office Ampara |
| 15 | ඉංජි. එම්.එම්.එම්.එම්. උවයිස් | SE | RDD Kalmunai |
| 16 | වෛද්‍ය එම්.ජී.එම්.ෆෂි | PD | DAPH -EP |
| 17 | එෆ්.රාසමොහන් | CE | RDD |
| 18 | කේ.සී.එම්. මුසම්මිල් | | |
| 19 | එ. මන්සූර් | ලේකම් | මාර්ග සංවධර්න අධිකාරිය |
| 20 | එන්.තමිල් වෙල්වම් | DCS Planning | Provincial Planning |
| 21 | එල්.කේ.ජී.මුතුබණ්ඩා | ලේකම් | MOA |
| 22 | වී.රවින්ද්‍ර | ජේ.සහකාර ලේකම් | Chief ministry |
| 23 | ජේ.ජේ. මුරලිදරන් | ලේකම් | Ministry of Health |
| 24 | වෛද්‍ය ඩී.ජී.එම්.කොස්තා | PDHS | Health |
| 25 | එස්.කුලේන්ද්‍ර කුමාර් | PDHS | අධ්‍යාපන |
| 26 | අනූෂ එන්.එම්. | ICTA | RDHS Ampara |
| 27 | එම්.එස්.ඒ. කලීස් | පලාත් අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 28 | පී.විභානර්න් | IE | පලාත් වාරිමාගර් දෙපාර්;මේන්තුව |
| 29 | එම්.එච්.එම්.ෆර්තයුස් | NTR | රියදුරු |
| 30 | එල්.ජී.වාමිනී සෝමදාස | නියෝජ්‍ය කොමසිරිස් | ගොවිජන සංවධර්න දෙපාර්තමේන්තුව |
| 31 | ඒ.ටී.එම්. රෆී | කොමසාරිස් | MC Akkaraipattu |
| 32 | ටී.එම්.ඵම්. අන්සාර් | ප්‍රාදේශීය ලේකම් | අක්කරපත්තු |
| 33 | වයි.පපාකරන් | ප්‍රාදේශීය ලේකම් | අලයාඩිවෙම්බු |
| 24 | යූ.පී. සදරුවන් අනුරුද්ද | ප්‍රාදේශීය ලේකම් | අම්පාර |
| 35 | ඒ.එම්.ඒ.කුමාරි | ප්‍රාදේශීය ලේකම් | දමන |
| 36 | එම්.එස්.එම්. රෂාන් | ප්‍රාදේශීය ලේකම් | ඉරක්කාමම් |
| 37 | ජේ.ලියාකත් අලි | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ |
| 38 | එස්.ජෙගරාජන් | ප්‍රාදේශීය ලේකම් | කාරතිවු |
| 39 | ආර්.රාහුලනයාගි | ප්‍රාදේශීය ලේකම් | නාවිතන්වේලි |
| 40 | ඒ.එම්.අබ්දුල් ලතීෆ් | ප්‍රාදේශීය ලේකම් | නින්දවූර් |
| 41 | බී.වී.එස්. ගුණසේන | ප්‍රාදේශීය ලේකම් | පදියතලාව |
| 42 | එම්.අයි. ෆෙමස් | ප්‍රාදේශීය ලේකම් | පොතුවිල් |
| 43 | එස්.එල්.එම්.හනිෆා | ප්‍රාදේශීය ලේකම් | සමන්තුරෙයි |
| 44 | චින්තන උදාර නානායක්කාර | ප්‍රාදේශීය ලේකම් | උහන |

## දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය
## 2023.10.06

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 45 | එන්.නවනීතරාජා | ප්‍රාදේශීය ලේකම් | ලාහුගල |
| 46 | ටී.ජේ.අදිෂයිරාජ් | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ උතුර |
| 47 | ටී.ගජේන්ද්‍රන් | ප්‍රාදේශීය ලේකම් | තිරුක්කෝවිල් |
| 48 | එච්.ටී.කුමාරගේ | ප්‍රාදේශීය ලේකම් | දෙහිඅත්තකණ්ඩිය |
| 49 | එම්.එජ්.සී.ඒ.සාෆිර් | ප්‍රාදේශීය ලේකම් | අඩ්ඩාලච්චේන |
| 50 | ඒ.එම්.අආසික් | ප්‍රාදේශීය ලේකම් | සායිදමරුදු |
| 51 | එම්.පී.එම්.වික්‍රමසිංහ | දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරී | |
| 52 | ඩී.එම්.උපාලිරත්න | ජ්‍යෙෂ්ඨ නිළධාරී | සිවිල් ආරක්ෂක බලකාය |
| 53 | එම්.අයි. ෆවුම් | සහකාර අධ්‍යක්ෂ | LUPPD |
| 54 | එන්.අන්බන් | සිවිල් ඉංජිනේරු | මහවැලි අධිකාරිය |
| 55 | ඒ.පී.කිතන් | CE | MASL |
| 56 | එස්.රවිකුමාර් | සහකාර අධ්‍යක්ෂ | NADDA |
| 57 | එන්.ටී.සම්පන්තන් | සහකාර ඉංජිනේරු | CEB |
| 58 | එච්.කේ.කුමාරසිරි | CAO | 24 සේනාංකය |
| 59 | කසුන් නිමන්ත | DC Ampara | ASMP |
| 60 | කසුන් සන්දීප | ESS Ampara | ASMP |
| 61 | පී.කාර්තිකිගන් | අධ්‍යක්ෂ | සෞඛ්‍ය |
| 62 | වී.කරුණානාතන් | පළාත් අධ්‍යක්ෂ | මාර්ග |
| 63 | වෛද්‍ය එස්.ඩී.එම්.මාහිර් | DD/Ampara | Dpt.Apth |
| 64 | ටී.ජී. ප්‍රියන්ත | DDE ( Planning) | දෙහිඅත්තකණ්ඩිය |
| 65 | ටී.සිවසුබ්‍රමනියම් | CE( RDA) | RDA |
| 66 | යූ.ඒ.බාරි | CE( RDA) | RDA |
| 67 | එස්.උදයරාජන් | AD | CEB |
| 68 | එල්.පී.ඩී.පී. ජයසේකර | Registar | Hardy CPT |
| 69 | එම්.ඒ.ලාල් කුමාර | SPO | DPCCS |
| 70 | ඉංජි. යූ.එල්.ඒ.වාහිර් | P/DI | P/Ir |
| 71 | ජී.එන්. ද සිල්වා | D/A | D/O |
| 72 | ඉංජි.පී.අච්චුදන් | ප්‍රධාන ඉංජිනේරු | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| 73 | එම්.ඒ.සී.එම්.රියාස් | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ඩී.එම්.සී. අම්පාර |
| 74 | ඉංජි. කපිල ජේ. පෙරේරා | RM | ජල සම්පාදන - අම්පාර |
| 75 | පී.එස්.එම්.එල්.ජයසිරි | RPMLC | MASL |
| 76 | ඒ.සී.අයි.බානු | ඉඩම් කොමසාරිස් | LCG's |
| 77 | ඉෂඩ්.ඒ.එම්.අස්මීර් | වධායක ඉජජිනේරු | මාගර් සංවධර්න අධිකාරිය |
| 78 | එම්.එස්.රිප්ලිකල් | CF-PD | වාරිමාගර් |
| 79 | ප්‍රදීප් එන් . මුණසිංහ | | Galoya Wildlife |
| 80 | එස්.පී. සන්දු | | Galoya NP |
| 81 | යූ.පී.ජේ.ඒකනායක | Deputy Manager | Timber Cooprration |
| 82 | එස්. තාට්පරන් | Divisional Assistant | Irrication Kalmunai |
| 83 | ඒ.ආර්. නෞෂාත් | Divisional Assistant | Irrication Akkaraipattu |
| 84 | ඒ.සී.එස්.විදුරංග | Excise Inspector | සුරාබදු කාර්යාලය අම්පාර |
| 85 | කේ.එල්.ඩී.බී.පී. සුමියරත් | EW | CEB |
| 86 | එල්.පී.ආර්.මධුරංග | AOT | DOB Ampara |
| 87 | එස්.ඒ.ඩී.ඩබ්. කුමාර | DIE Ampara | Irrigation |
| 88 | එස්.ඒ.ඩී.තුසිත | DS | SLPB |

## දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය

**2023.10.06**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 89 | යූ.කේ.එම්. මුසාජිත් | කළමණාකරු | ජලසම්පාදන මණ්ඩලය |
| 90 | අයි.එල්.එම්.ඒ.ජිෆ්රි | AE | ජලසම්පාදන මණ්ඩලය |
| 91 | එස්.ආර්. හසන්ති | ZDE | ZEO/ Ampara |
| 92 | එස්.සතීෂ් කුමාර් | AD | AIB |
| 93 | කේ.සිවකුමාර් | සමුද්‍ර පරිසර නිළධාරී | සමුද්‍ර පරිසර ආරක්ෂණ අදිකාරිය |
| 94 | එම්.ඒ.ජයා | ADFO | Forest |
| 93 | එච්.එම්.රහමතුල්ලා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 96 | ජී.ඩී.අයි.රම්‍යලතා | RPM | වාරිමාගර් |
| 92 | එන්.පී.එස්.ඩබ්. ජයන්ත | DMT | DMT |
| 98 | බී.එල්.පී.යූ. සිල්වා | ජේ.මිනින්දෝරු අධිකාරී | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 99 | ආර්.එම්.නිලූක | ප්‍රාදේශීය සහකාර | වාරිමාගර් |
| 100 | කේ. ෂිවකුමාර් | DSSO | |
| 101 | එස්.එල්.ඒ.කේ.නෙත්මිනි | ACLG | ACLG Office |
| 102 | එන් .රමේෂ් | C A | Kachcheri |
| 102 | ඉංජි.එම්.ආර්.එම්.ෆාරිස් | RME | GSMB |
| 104 | එස්.එල්.ආදම්බාවා | ප්‍රධාන ගණකාධිකාරී | කච්චේරි |
| 105 | ජී.කේ.සි.කරුණාරත්න | OIC | UDA |
| 106 | එම්.එස්.එස්.නිජාම් | ZDE | Kalmunai |
| 107 | කේ.එල්.එම්. ස්මයිල් | CE (RDA) | RDA |
| 108 | ජී.ඩී.ඩී.ලක්මාල් | EE/Dehiattakandiya | RDA |
| 109 | එච්.ඒ.ජී. සාගර | AD | MYSC |
| 110 | එම්.එස්.නජිමුදීන් | EE/RDA | RDA/ Ampara |
| 111 | කේ.ටී.එස්.කුමාර | Head of agriculture | Galoya Plantation |
| 112 | අතුල උඩපමුණුව | ප්‍රාදේශීය කළමණාකරු | වී අලෙවි මණ්ඩලය |
| 113 | කේ.එච්.පී.පී.කුමාර | ARM | PMB |
| 114 | එම්.එස්.එම්.සප්‍රාස් | අධ්‍යක්ෂ සමෘද්ධි | සමෘද්ධි අධිකාරිය |
| 115 | එම්.පී.සී.පී.කුමාරි | CSD | CSD |
| 116 | වෛද්‍ය එම්.සී.එම්.මාහීර් | ad RDAS | Health |
| 117 | එම්.එස්.නෆීල් මොහොමඩ් | DDE | ZEO Thirukkovil |
| 118 | කේ.බී.සීග වින්දායා කුමාරි | HCDO | Co-operative |
| 119 | එම්.අයි.එම්.නෞෂාඩ් | EA | CBA |
| 120 | යූ.එම්.ඒ.බණ්ඩාර | ප්‍රධාන කළමණාකරු | ගල්ඔය වැවිලි සමාගම |
| 121 | එම්.එස්.හස්මි | ජේ. කම්කරු නිළධාරී | අම්පාර |
| 122 | ආර්.එම්.ඩී.විජිත | CRM East | SLTB East |
| 123 | ඒ.එම්.එන්.බී.අලහකෝන් | කලාප නිළධාරී | භූ විද්‍යා |
| 124 | ඩී.එම්.පී.ගුණරත්න | Assistant Registrar | Hardy All |
| 125 | එම්. කේප්‍රන් | Exploration Officer | භූ විද්‍යා |
| 126 | ඒන්.පී.බී.පෙතියාගොඩ | ලේකම් | නගරසභාව -අම්පාර |
| 127 | ආර්.එම්.සිරිවර්ධන | ලේකම් | ප්‍රාදේශීය සභාව - ලාහුගල |
| 128 | අනෝමා රාජපක්ෂ | ලේකම් | ප්‍රාදේශීය සභාව - දමන |
| 129 | එම්.ඒ.පී. මැදගොඩ | ලේකම් | ප්‍රාදේශීය සභාව - උහන |
| 130 | එල්.ජී.අයි.පී.කුමාර | ලේකම් | ප්‍රාදේශීය සභාව - මහඔය |
| 131 | ජී.ජී.ධර්මසිලි | ලේකම් | ප්‍රාදේශීය සභාව - පදියතලාව |
| 132 | අයි.ජී.එස්.ජී කුමාරි | ලේකම් | ප්‍රාදේශීය සභාව - දෙහිඅත්තකණ්ඩිය |

## දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය

## 2023.10.06

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 133 | ඒම්.ඒ.කේ. මොහොමඩ් | ලේකම් | ප්‍රාදේශීය සභාව - සම්මන්තුරය |
| 134 | එල්.එම්.ඉර්ෆාන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අක්කරලත්තු |
| 135 | හබීබුරාහමන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - පොතුවිල් |
| 136 | එම්.ආර්.එම්.රෂීඩ් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නින්දවර් |
| 137 | එස්. පහීරතන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාවිදන්වෙලි |
| 138 | එම්.අය්.එම්. ෆායිස් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අඩ්ඩාලච්චේන |
| 139 | අයි. සුරේස්රම් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අලයාඩිවෙම්බු |
| 140 | ජේ. වීරපතිරණ | ලේකම් | ප්‍රාදේශීය සභාව -තිරුක්කෝවිල් |
| 141 | ජේ.චන්ද්‍රේශ්වරම් | ලේකම් | ප්‍රාදේශීය සභාව - කාරතිව් |
| 142 | ඒ.ඒල්.ඒම්. අශ්මි | ලේකම් | ප්‍රාදේශීය සභාව - කල්මුණ |
| 143 | ඒ.ඒල්.ඒම්. ෂහීර් | ලේකම් | ප්‍රාදේශීය සභාව - එරගම |